අද 2016 04.01

# ශ්‍රී ලංකාවේ මිලියන 9 ක් ආර්ථික වශයෙන් ක්‍රියාශීලීයි

## - ඇස්තමේන්තුගත රැකියා නියුක්තිය මිලියන 8.6 යි
## - 68% ක් සතියකට පැය 40 ට වඩා සේවයේ යෙදිලා

**සමිල පෙරේරා**

2015 හතර වැනි කාර්තුවට අනුව ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය මිලියන 8.9 ක් බවත්, ඉන් 64.5% ක ප්‍රතිශතයක් පිරිමි ජනගහනය වන අතර, 35.5% ක ප්‍රතිශතයක් ගැහැනු ජනගහනය බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

PAGE 4

PAGE 1

## ශ්‍රී ලංකාවේ මිලියන 9...

ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය, රැකියා වියුක්තිය හා ශ්‍රම බලකාය වැනි සංඛ්‍යාති රැසක උපනතිය පිළිබඳ කාලීන දත්ත ඉදිරිපත් කිරීමේ අරමුණින් පවත්වන ශ්‍රී ලංකා ශ්‍රම බළකා සමීක්ෂණය මගින් මෙම තොරතුරු අනාවරණය කරගෙන තිබේ.

2015 හතරවැනි කාර්තුවට අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බළකා සහභාගීත්ව අනුපාතය 53.6 ක් වන අතර, ඉන් 75.4 ක ප්‍රතිශතයක් පුරුෂයන්ද, 35.2 ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් බවද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.

එමෙන්ම, මෙම කාර්තුව සඳහා ඇස්තමේන්තුගත රැකියා නියුක්තිකයන් ප්‍රමාණය මිලියන 8.6ක් වේ. ඒ අතරින්, 47.2% ක් සේවා අංශයේද, 27.5% ක් කෘෂිකාර්මික අංශයේද, 25.3% ක් කර්මාන්ත අංශයේද නිරත වී ඇත. එහිදී, ඉහළම සේවා නියුක්තියක් සේවා අංශයේ දක්නට ලැබෙන අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම එම රටාව දක්නට ලැබේ. මීට අමතරව, 68% ක ප්‍රතිශතයක් සතියකට පැය 40කට වඩා සේවයේ යෙදී ඇති බවද වාර්තා වී තිබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතා පවසා සිටියේ 2015 හතර වැනි කාර්තුවේදී ඇස්තමේන්තුගත රැකියා වියුක්ති අනුපාතය 4.3% ක් වන බවය. තවද, 2015 තුන්වැනි කාර්තුවේදී එම අනුපාතය 5.0% ක් පමණ වූ බවද ඔහු පවසා සිටියේය. මුළු රැකියා විරහිත පුද්ගලයන් ප්‍රමාණය, ශ්‍රම බළකායේ ප්‍රතිශතයක් ලෙස රැකියා වියුක්ති අනුපාතය ලෙස හඳුන්වනු ලබයි.

නිවාස ඒකක 6,250ක නියැදියක් භාවිතයෙන් 2015 හතර වැනි කාර්තුව සඳහා ශ්‍රම බළකා සංඛ්‍යාත නිකුත් කර ඇති අතර, එම කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු 2015 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවලදී මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකර ඇත.

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO